# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/මැතැර/221/19 ඔබේ අංකය :

2019.11.04

ගරු ලේකම්තුමා,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල,
BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**<u>සහකාර පොලිස් අධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගයක් පැවැත්වීම.</u>**

2018.07.10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨතාවය මත ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුන් 144 දෙනෙකුට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා දෙන ලදී.

තවද 2019.10.01 ඉදුරා බඳවාගැනීම් පදනම මත සහකාර පොලිස් අධිකාරී වරුන් 14 දෙනෙකු බඳවා ගෙන ඇත.

අනුමත බඳවාගැනීම් පටිපාටිය අනුව ජ්‍යෙෂ්ඨතාවයට 50% ක් ද, ඉදුරා බඳවාගැනීම් 25% ක් ද, කුසලතාවය මත 25% ක් ද, සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම් හා උසස්වීම් ලබා දිය හැකිය.

මේ වන විට ජ්‍යෙෂ්ඨතාවය මත හා ඉදුරා බඳවාගැනීම් මත සහකාර පොලිස් අධිකාරීවරුන් පත්කර ඇති අතර, 2007 වර්ෂයෙන් පසු කුසලතා පදනම මත සහකාර පොලිස් අධිකාරීවරුන් බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගයක් පවත්වා නොමැත.

දැනට ශ්‍රී ලංකා පොලිසියේ කුසලතාවය මත සීමිත තරඟ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇති නිලධාරීන් විශාල ප්‍රමාණයක් සිටී.

මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකර ඉතා කඩිනමින් සහකාර පොලිස් අධිකාරී ධූරයට උසස් කිරීම සඳහා සීමිත තරඟ විභාගයක් පවත්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

**නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි**
**නීතිවේදී (ගෞරව)**
**ගරු ලේකම්,**
**ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය**

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.